# ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

# පුරප්පාඩු

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමට මෙහි දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) - කොන්ත්‍රාත්

**I. අවශ්‍ය මූලික සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/ රාජ්‍ය කළමනාකරණය/ආයතන කළමනාකරණය පිළිබඳ හෝ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම

**සහ**

උපාධි සුදුසුකම් ලබාගත් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

**සැ.යු. :** ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ පළපුරුද්ද සහිත විශ්‍රාමික නිලධාරීන් කෙරෙහි ද සළකා බලනු ලැබේ.

**II. වැටුප් ක්‍රමය : සාකච්ඡා කර තීරණය කළ හැක.**

සියලුම විස්තර සහිතව සකස් කරන ලද අයදුම්පතක්, සහතික පිටපත් ද සහිතව කොළඹ 07, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ, අධ්‍යක්ෂ ජනරාල් වෙත 2021.12.15 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ තනතුර සඳහන් කරන්න. දෙපාර්තමේන්තු සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන ඉල්ලුම්කරුවන් තම අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව,**
**කොළඹ 07.**